**ශීර්ෂය 311 - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව**
**2016 වර්ෂය**

---

ශීර්ෂය 311 - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 03 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 291.80 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 184.39 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 107.41 ක් හෙවත් සියයට 36.81 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 182.70 | 175.93 | 6.77 | 3.71 |
| මූලධන | 109.10 | 8.46 | 100.64 | 92.25 |
| **එකතුව** | **291.80** | **184.39** | **107.41** | **36.81** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 31101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 12.00 | 11.57 | 7.00 | 8.13 | 60.00 | 33.96 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුවේ අංක 6000/0000/00/0018/0020/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 4.13 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදි නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (iii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

| | | |
|---|---|---|
| (iv) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛන | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 62 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.2.2 වෙනත් අමාත්‍යාංශ විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ දෙකක් විසින් එකතුව රු.මිලියන 62.06 ක් වූ ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණු අතර එම ප්‍රතිපාදන වලින් එකතුව රු.මිලියන 6.07 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.මිලියන 55.99 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

වෙනත් පාර්ශවයන් විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.මිලියන 4.11 ක් අදාළ කාර්යභාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**3.4 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 31101 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 1.29 ක් වූ අතර එම හිඟ හිටි ණය ශේෂයෙන් රු.987,278 ක් 2017 සැප්තැම්බර් 30 දින වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද සැසඳුම් ප්‍රකාශයේ වූ කේවල ශේෂ එකතුව රු.157,273 කට අදාල ණය ශේෂ 07ක ලිපිගොනු අස්ථානගත වී තිබුණි.

**3.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

දෙපාර්තමේන්තුව විසින් 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 3.5.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 9.1 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.

## 3.5.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් එම වාර්තාව 2017 අගෝස්තු 03 දින වන විටත් පිළියෙල කර විගණකාධිපති වෙත පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2014 පෙබරවාරි 26 දින දෙපාර්තමේන්තුව සතු මෝටර් රථයක් අනතුරුට පත්වී තිබුණත්, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරිදි ක්‍රියාමාර්ග නොගෙන සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ නවතා තිබුණි. එම වාහනය රක්ෂණය කර නොතිබුණු බැවින් සිදුවූ අලාභය සම්බන්ධ රක්ෂණ වන්දිද ලබා ගැනීමට නොහැකි වී තිබුණි. අනතුරින් පසුව ආයතන පරිශ්‍රයේදී පැවැති එම රථයේ කැසට් යන්ත්‍රය හා රියදුරු අසුන අස්ථානගතවී තිබුණු බව අදාල ලිපිගොනුව පරීක්ෂාවේදී නිරීක්ෂණය වුවද, එම අලාභ හා හානි සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කර නොතිබුණු අතර දෙපාර්තමේන්තුවේ හානි ලේඛනයේද මේ සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.5 ඡේදය ප්‍රකාරව ඌනතා, අතිරික්තතා, විනාශ කළ යුතු භාණ්ඩ, අළුත්වැඩියා කළ යුතු භාණ්ඩ, විකිණිය යුතු භාණ්ඩ හා වෙනත් රජයේ ආයතනවලට පැවරිය යුතු භාණ්ඩ සම්බන්ධයෙන් අදාළ ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

## 3.7 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

2016 වර්ෂයේදී අනුරාධපුර ලෝලුගස්වැව ව්‍යාපෘතිය වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් රු.මිලියන 100 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ඒ අනුව රු.මිලියන 20 ක අග්‍රිම දෙපාර්තමේන්තුව වෙත නිකුත් කර තිබුණි. නමුත් ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් ක්‍රියාවලිය අපේක්ෂිත පරිදි ඉටු නොකිරීම හා ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නැවත ලබා ගැනීමට සිදුවීම නිසා එම ව්‍යාපෘතියට අදාළ කිසිඳු කාර්යයක් සමාලෝචිත වර්ෂයේදී ඉටු කිරීමට නොහැකි වීම නිසා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

**3.8 කාර්යසාධනය**

----------------

ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියක් සැකසීම, ජාතික භෞතික සැලැස්මක් පිළියෙල කිරීම හා භෞතික සැලැස්ම ක්‍රියාත්මක වීම නියාමනය කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වුවද එම සැලැස්මට අනුව පූජාභූමි සංවර්ධන කටයුතු වෙනුවෙන් සකස් කළ ව්‍යුහාත්මක සැලසුම්වල ක්‍රියාකාරිත්වය පිළිබඳ නියාමන කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදුකර නොතිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 51 | 12 | 39 |
| (ii) | තෘතීයික මට්ටම | 08 | 01 | 07 |
| (iii) | ද්විතීයික මට්ටම | 115 | 79 | 36 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 213 | 188 | 25 |
| | **එකතුව** | **387** | **280** | **107** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ ද්විතියික මට්ටමේ නිලධාරීන් 36 දෙනෙකුගේ පුරප්පාඩු පැවැතියද, 2016 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 04 දෙනෙකු වෙනත් පාර්ශවයන් වෙත මුදා හැර තිබුණි.